කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 9 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය: පැය දෙකයි |
|---|---|---|

නම: .............................................................................

1 පත්‍රය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. කාලගුණය හා දේශගුණය සම්බන්ධ සංසිද්ධි වන උෂ්ණත්වය , වර්ෂාපතනය , පීඩනය ආදී ක්‍රියාවලීන් සිදුවන වායු ස්තරය කුමක් ද?
   i. අපරිවර්තී ගෝලය  iii. පරිවර්තී ගෝලය
   ii. මෙසෝ ගෝලය  iv. තාප ගෝලය

02. ආසියානු කලාපයේ ජල හිඟතාවයට මුහුණපාන හා ගංවතුර උවදුරට දැඩිවම ලක්වන රටවල් දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   i. පකිස්ථානය හා බංගලාදේශය  iii. පකිස්ථානය හා නේපාලය
   ii. නේපාලය හා බංගලාදේශය  iv. මාලදිවයින හා ශ්‍රී ලංකාව

03. ලොව ගොඩබිම පිහිටි ගැඹුරුම ස්ථානය වන්නේ,
   i. එවරස්ට් කන්දයි  iii. කැස්පියන් මුහුදයි
   ii. මළ මුහුදයි  iv. බයිකල් විලයි

04. හෙල්මළු ක්‍රමයට වී වගාව කරනු ලබන්නේ,
   i. කඳුකර ප්‍රදේශවලය  iii. බදුල්ල දිස්ත්‍රික්කයේ පමණි
   ii. වියළි කලාපයේ ය.  Iv. තෙත් කලාපයේ ය

05. කොළඹ පුරවර ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්ක තුන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
   i. කොළඹ, කළුතර, ගාල්ල  iii. ගාල්ල, මාතර, කළුතර
   ii. කොළඹ , ගම්පහ, කෑගල්ල  iv. කොළඹ, ගම්පහ, කළුතර

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති වගන්තිවල හිස්තැන සඳහා සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

06. ලොව සෑම මහාද්වීපයකම කඳුවැටි පිහිටා ඇත.ඒ අතරින් ..........................කඳු දකුණු ඇමෙරිකාවේ බටහිර පැත්තේ විහිදී ඇත. (රොකී, අන්දීස්, ඇල්ප්ස්)

07. ඉහළ අක්ෂාංශික ප්‍රදේශවල අධික ශීතලට ඔරොත්තු දෙන ලෙස සකස් වූ ඉග්ලූ නිවාසවල .................................... ජීවත් වෙති. (ඇස්කිමෝවරු, ඇස්ටෙක්වරු, පිග්මිවරු)

08. ................................. දේශගුණය පවතින ප්‍රදේශ කෘෂිකර්මාන්තයට හිතකර වේ. (වියළි, නිවර්තන මෝසම්, ශීත)

09. "සාහිත්‍යයටත්, ඉතිහාසයටත්, කලාවටත් අයිති වන දේ සංස්කෘතිය වේ".යන කියමන ........................................ කියන ලද්දකි.

(වාල්ස් ඒ එල්වුඩ්, ඊ.බී. ටයිලර්, බර්ට්‍රන්ඩ් රසල් සාමි)

10. වර්ෂ 1997 අරඹන ලද .................................. සංවිධානය බහු ක්ෂේත්‍ර තාක්ෂණික හා ආර්ථික සබඳතා සඳහා වන බෙංගාල බොක්ක කලාපීය සංවිධානය ලෙසද හඳුන්වයි.
(බිම්ස්ටෙක්,ආසියාන්,සාර්ක්)

11 සිට 15 දක්වා වගන්තිවල හිස්තැනට ගැලපෙන පද යොදා හිස්තැන් පුරවන්න.

11. හෝර්ටන් තැන්නෙන් ආරම්භ වී ත්‍රිකුණාමලය අසලින් මුහුදට වැටෙන මහවැලි ගංගාවේ මුළු දිග කි. මී .................................. කි.

12. මුලතිව් දිස්ත්‍රික්කයේ ............................ හි ලංකාවේ උසම බහු සංනිවේදන ජාල කුළුණ ඉදි කර තිබේ.

13. 1:50000 භූ ලක්ෂණ සිතියම් වල M. N. අක්ෂර වලින් දැක්වෙන්නේ ........................................ය.

14. සිරිත් විරිත්, සම්ප්‍රදායයන්, භාෂාවන් , නැටුම්,හා සාහිත්‍යය ................................ ලෙස හැඳින්වේ.

15. පෘථිවි ගෝලයෙන් ශිලා ගෝලයට අයත් වන ප්‍රමාණය ............................ කි.

ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

16. නිල් ග්‍රහයාගේ භෞතික පරිසරයත් මානුෂ පරිසරයත් අතර අන්තර් සම්බන්ධතාවක් නැත. (        )

17. වායු, ජල, ශිලා ගෝල අතර ජලය හුවමාරු වීමේ ක්‍රියාවලිය ජල සංසරණය ලෙස හැඳින්වේ. (        )

18. හික්කඩුව නැගෙනහිර පළාතේ පිහිටා තිබෙන දර්ශනීය වෙරළකට උදාහරණයක් වේ. (        )

19. චීනය හා ඉන්දියාව ආසියාවේ පිහිටි ජනාධිකම රටවල් දෙක වේ. (        )

20. IBM පරිගණක සෑදීම නව කාර්මික රටවල පරිගණක එකලස් කිරීමේ කර්මාන්තයට උදාහරණයක් ලෙස දැක්වීමට පුළුවන. (        )

11 කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

01) දෙවන වාරයට නියමිත ඇගයීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ විසින් ඇගයීම සඳහා කරන ලද ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)

ii. ඉහත ක්‍රියාකාරකමට පාදක වූ පාඩම් ඒකකය කුමක් ද? (ලකුණු 02)

iii. ඔබ විසින් එයට යෙදූ මාතෘකාව ලියන්න. (ලකුණු 02)

iv. එම ක්‍රියාකාරකම කිරීමට උපයෝගී කොටගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

v. එම ක්‍රියාකාරකම කිරීම තුළින් ඔබ කණ්ඩායමට ලැබුණු අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

vi. ක්‍රියාකාරකම කිරීමේදී ගුරුතුමා හෝ ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

02) i. පෘථිවිය නිල්ග්‍රහයා ලෙස හඳුන්වන්නේ ඇයි? (ලකුණු 02)

ii. ශිලාගෝලයෙහි දැකගත හැකි භෞතික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ගං වතුර නිසා ඇතිවන ගැටලු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03)i. ආසියානු ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ලකුණු 02)

ii.දී ඇති ආසියානු සිතියමේ ABCD වලින් දක්වා ඇති ප්‍රදේශ හතර නම් කරන්න. (ලකුණු 04)

සිතියම




iii. ආසියානු ප්‍රදේශයේ දැකිය හැකි දේශගුණ වර්ග දෙකක් ලියා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

04) i. ආසියානු කලාපයේ තිබෙන ස්වභාවික සම්පත් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මෙම කලාපයේ තිබෙන නිවර්තන වනාන්තර වල ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

iii.මෙම වනාන්තර විනාශ කිරීම නිසා මිනිසාට මුහුණ පෑමට සිදුවන ගැටලු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

05)i. සංස්කෘතියේ ස්වභාවය වෙනස් වීමට බලපාන සාධක හතරක් දක්වන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවෙන් පිට ආසියානු කලාපයට අයත් ලෝක උරුම දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. සංචාරක සත්ව පාලනය යටතේ තිබුණු බිම් ක්‍රමයෙන් හැකිලී යමින් පවතී. එයට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06) i. සංවර්ධනය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. කොළඹ පුරවර ප්‍රදේශය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

iii . කොළඹ පුරවර කලාපයේ මතුව තිබෙන ගැටළුවක් වන පරිසර දූෂණය වලක්වා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

07)i. මහවැලි සංවර්ධන ව්‍යාපාරයට අයත් ජල විදුලි බලාගාර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. දකුණු පළාත් සංවර්ධනය සඳහා ආධාර ලබා දුන් විදේශ ආයතන දෙකක් දක්වන්න. (ලකුණු 04)

iii. ඌව ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)